රාජ්‍ය භාෂා කොමිෂන් සභාව

அரசகரும மொழிகள் ஆணைக்குழு

OFFICIAL LANGUAGES COMMISSION





2018 වාර්ෂික වාර්තාව

வருடாந்த அறிக்கை

ANNUAL REPORT

2018

වාර්ෂික වාර්තාව

රාජ්‍ය භාෂා කොමිෂන් සභාව

“ජනජයසිටි” ගොඩනැගිල්ල,
09 වන මහල,
නාවල පාර,
රාජගිරිය.

2018 වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තාව

රාජ්‍ය භාෂා කොමිෂන් සභාව 1991 අංක 18 දරන රාජ්‍ය භාෂා කොමිෂන් සභා පනතෙහි විධිවිධාන වලට අනුකූලව ස්ථාපනය කරන ලද ව්‍යවස්ථාපිත ආයතනයකි.

01. දැක්ම

මහජනයා වෙත සේවය සපයනු ලබන සියළු ආයතනවල රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට බලගැන්වූ ආයතනය බවට පත්වීම.

02. මෙහෙවර

රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් විමර්ෂණය, අධීක්ෂණය, අධ්‍යාපනය සහ උපදේශනය මගින් මහජනතාවගේ ද්වීභාෂාමය අවශ්‍යතා සැපයීම.

03. අරමුණු

කොමිෂන් සභාවේ පොදු අරමුණු පහත සඳහන් පරිදි වේ.

(අ) රාජ්‍ය භාෂා භාවිතය පිළිබඳ ප්‍රතිපත්තිමය මූලධර්ම නිර්දේශ කිරීම සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ අන්තර්ගත විධිවිධාන අනුව ක්‍රියාකිරීම පිළිබඳව විමසිලිමත් වීම හා අධීක්ෂණය කිරීම.

(ආ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 18 වන ව්‍යවස්ථාවෙහි සඳහන් භාෂා භාවිතය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ භාවාර්ථයට හා චේතනාවට අනුකූලව සිදුවන බවට වගබලා ගැනීම සඳහා අවශ්‍ය විය හැකි සියලු ක්‍රියාවන් කිරීම සහ පියවර ගැනීම.

(ඇ) රාජ්‍ය භාෂා ඇගයීම, දිරිගැන්වීම සහ ඒවායේ තරාතිරම, සමානත්වය සහ භාවිත කිරීමේ අයිතිවාසිකම පිළිගැනීම, පවත්වාගෙන යාම සහ ඉදිරියට ගෙන යාම.

(ඈ) සිය මෙහෙයවීමෙන් සහ ලැබෙන යම් පැමිණිලිවලට ප්‍රතිචාර වශයෙන් යන දෙයාකාරයෙන්ම විමර්ශන පැවැත්වීම හා මේ පනතේ විධිවිධාන වලින් සලසා ඇති පරිදි ප්‍රතිකර්ම යෙදීම.

04. ප්‍රධාන කාර්යයන්

උක්ත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා කොමිෂන් සභාව ප්‍රධාන කාර්යයන් හතරක් ඉටුකරනු ලබයි.

1. ප්‍රතිපත්තිමය මූලධර්ම සම්පාදනය - උපදේශනය

2. රාජ්‍ය භාෂා භාවිතය පිළිබඳව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන රාජ්‍ය යාන්ත්‍රණය විසින් නිසි පරිදි අනුගමනය කරන්නේද යන්න ගැන - අධීක්ෂණය

3. අදාළ භාෂාවල තරාතිරම හෝ භාවිතය පිළිබඳව - අධ්‍යාපනය

4. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අන්තර්ගත භාෂා අයිතීන් උල්ලංඝනය කිරීම පිළිබඳ පැමිණිලි - විමර්ශනය

05. සංවිධාන ව්‍යූහය

(අ) රාජ්‍ය භාෂා කොමිෂන් සභාව පත්කරනු ලබන්නේ ජනපතිවරයා විසිනි. කොමිෂන් සභාව සාමාජිකයන් හයදෙනෙකුගෙන් සමන්විතවේ. එක් සාමාජිකයෙකු කොමිෂන් සභාවේ සභාපති වශයෙන් නම් කරනු ලබයි. සභාපතිවරයා කොමිෂන් සභාවේ ප්‍රධාන විධායක නිලධාරියාද වේ.

2017/08 /31 දින පත් කරන ලද කොමිෂන් සභාව පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත විය.

1. රන්ජිත් උයන්ගොඩ මහතා සභාපති 2017.08.31 සිට 2018.03.17
2. මහාචාර්ය, පූජ්‍ය කිවුලේගෙදර නාරද හිමි සාමාජික 2017.02.14 සිට 2018.03.17
3. ජීවන් ත්‍යාගරාජා මහතා සාමාජික 2017.02.14 සිට 2018.03.17
4. ඒ. එම්. එම්. නෞෂාඩ් මහතා සාමාජික 2017.02.14 සිට 2018.03.17
5. නන්දිනී විජයරත්නම් මහත්මිය සාමාජික 2017.02.14 සිට 2018.03.17
6. මහාචාර්ය සෝමසුන්දරම් සන්දරසේකරම් සාමාජික 2017.02.14සිට 2018.03.17

2018/04 /04 දින පත් කරන ලද කොමිෂන් සභාව පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත විය.

7.	මහාචාර්ය සෝමසුන්දරම් සන්දරසේගරම් මහතා	සභාපති	2018.04.04 සිට 2018.12.31
8.	ආචාර්ය, පූජ්‍ය අකුරටියේ නන්දනායක හිමි	සාමාජික	2018.04.04 සිට 2018.12.31
9.	ජීවන් ත්‍යාගරාජා මහතා	සාමාජික	2018.04.04 සිට 2018.12.31
10.	නන්දිනී විජයරත්නම් මහත්මිය	සාමාජික	2018.04.04 සිට 2018.12.31
11.	එල්.බී. කුමුදුලාල් මහතා	සාමාජික	2018.04.04 සිට 2018.12.31
12.	එස්. මොහිදීන් මහතා	සාමාජික	2018.04.04 සිට 2018.12.31

මෙම කාලසීමාව සඳහා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ (1) වන පන්තියේ සැනුජී රුවිනිකා පෙරේරා මහත්මිය නිලබලයෙන් කොමිෂන් සභාවේ ලේකම් වශයෙන් කටයුතු කරන ලදි.

(අ) 2018/12/31 දිනට රාජ්‍ය භාෂා කොමිෂන් සභාවෙහි සංවිධාන ව්‍යුහය



(ආ) කාර්ය මණ්ඩලය

2018.12.31 දින වනවිට කොමිෂන් සභාවේ සේවය කළ කාර්ය මණ්ඩලය

අනු අංකය	නිල නාමය	අනුමත සේවක සංඛ්‍යාව	තත්‍ය සේවක සංඛ්‍යාව	සටහන
01.	අධ්‍යක්ෂ	01	-	පුරප්පාඩු 01
02.	සහකාර අධ්‍යක්ෂ	01	01	
03.	භාෂා නිලධාරි	03	01	පුරප්පාඩු 02
04.	පරිපාලන නිලධාරි	01	01	
05.	මූල්‍ය නිලධාරි	01	-	පුරප්පාඩු 01
05.	ප්‍රධාන ලිපිකරු	01	01	
06.	භාෂා ප්‍රවර්ධන හා විමර්ශන නිලධාරි	10	03	පුරප්පාඩු 07
07.	සංවර්ධන නිලධාරි	04	-	පුරප්පාඩු 04
08.	කළමනාකරණ සහකාර	10	08	පුරප්පාඩු 02
09.	භාෂා පරිවර්තක (දෙමළ/ ඉංග්‍රීසි)	01	-	පුරප්පාඩු 01
10.	භාෂා පරිවර්තක (සිංහල/ ඉංග්‍රීසි)	01	-	පුරප්පාඩු 01
11.	භාෂා පරිවර්තක (සිංහල/ දෙමළ)	01	-	පුරප්පාඩු 01
12.	රියදුරු	03	02	පුරප්පාඩු 01
13.	කාර්යාල කාර්ය සහායක	04	03	පුරප්පාඩු 01
	මුළු සංඛ්‍යාව	**42**	**20**	**පුරප්පාඩු 22**

II කොටස

(06) භාෂා විගණන

භාෂා විගණන කොමිෂන් සභාවේ අධීක්ෂණ කාර්යයට අදාල වන ක්‍රියාකාරකමකි. මෙහිදී රාජ්‍ය ආයතනවල රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිළිබඳව කොමිෂන් සභාව සෘජුව පරීක්ෂාවට ලක්කර හඳුනාගනු ලබන රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට අනුකූල නොවන තත්ත්වයන් සම්බන්ධයෙන් නිර්දේශ නිකුත් කිරීම සහ එම නිර්දේශ ක්‍රියාත්මක කිරීම පසු විපරම් කිරීම කොමිෂන් සභාව මගින් සිදුකරනු ලබයි.

භාෂා විගණන වලදී කොමිෂන් සභාව රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට අදාල දත්ත රැස්කිරීම සඳහා ප්‍රශ්නාවලියක් භාවිතා කරනු ලබයි. විගණන සඳහා තෝරාගනු ලබන ආයතන වෙත මෙම ප්‍රශ්නාවලිය පළමුව ඉදිරිපත් කරයි. මෙමඟින් අපේක්ෂා කරනුයේ ක්ෂණිකව ලබාගත නොහැකි තොරතුරු සම්බන්ධයෙන් පෙර සූදානමක් ආයතනයේ ඇති කිරීමයි. එම ප්‍රශ්නාවලිය සමඟ විගණන සඳහා දින යොදාගැනීම සිදුකරයි.

කොමිෂන් සභාවෙහි භාෂා විගණන කණ්ඩායම හයදෙනෙකුගෙන් පමණ සමන්විත වෙයි. සහකාර අධ්‍යක්ෂ හෝ භාෂා නිලධාරි ප්‍රමුඛ භාෂා ප්‍රවර්ධන හා විමර්ශන නිලධාරීන් තිදෙනෙකු, කළමනාකරණ සහකාර නිලධාරියෙකු සහ කාර්යාල කාර්ය සහායකයෙකු මෙම කණ්ඩායමට අයත් වේ.

විගණන කණ්ඩායම යොදාගත් දින අනුව අදාළ ආයතනය විගණනය කරනු ලබයි. මෙහිදී ප්‍රශ්නාවලිය මඟින් ඉදිරිපත් කරන ලද තොරතුරු ද සැලකිල්ලට ගෙන පහත සඳහන් නිර්ණායකයන්ට අනුව විගණනය සිදු කරනු ලබයි.

1. ආයතන පරිශ්‍රයේ මහජන ප්‍රදර්ශනය කරනු ලබන සියළුම පුවරු, (නාම පුවරු, තොරතුරු පුවරු, උපදෙස් පුවරු)
2. මහජන සේවය සඳහා භාවිතා කරනු ලබන සියළුම ලේඛන
3. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් දැනුවත්භාවය
4. නිලධාරීන්ගේ සන්නිවේදන හැකියාව
5. සිංහල/ දෙමළ පුහුණු පාඨමාලා
6. නිලධාරීන්ගේ භාෂා ප්‍රවීණතාවය
7. වෙබ් අඩවිය
8. පරිවර්තන කටයුතු
9. පිවිසුම් කාර්යාල පසුබිම
10. ආයතනයට අදාළ විශේෂිත කරුණු (උදා-: පොලිස්ථාන - පැමිණිලි සටහන් කිරීම
උප්පැන්න/ විවාහ/ මරණ රෙජිස්ට්‍රාර් - සහතික පත්‍ර රාජ්‍ය භාෂාවලින් ලබාදීම.)

මෙම පරීක්ෂාවේදි රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් පවතින අනනුකූලතාවයන් සියල්ල හඳුනාගනු ලබයි. එම අනනුකූලතාවයන් නිවැරදි කිරීම සඳහා අදාළ ආයතන ප්‍රධානියා වෙත නිර්දේශ නිකුත් කරනු ලබයි. එම නිර්දේශ මාස 3ක කාලසීමාවක් තුලදී නිවැරදි කර කොමිෂන් සභාව වෙත වාර්තා කල යුතුය. මෙම වර්ෂය තුලදී සිදුකල භාෂා විගණන වගුව 1 මගින් දැක්වේ.

භාෂා විගණනය

(2018 ජනවාරි සිට 2018 දෙසැම්බර් දක්වා)

අනු අං.	ස්ථානය	දිනය
1	දෙහිවල පොලිස් ස්ථානය	2018.01.09
2	සමෘද්ධි මූලස්ථානය - දෙහිවල	2018.01.09
3	ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය-දෙහිවල	2018.01.10
4	තැපැල් කාර්යාලය - දෙහිවල	2018.01.10
5	මහජන පුස්තකාලය - දෙහිවල	2018.01.11
6	මධ්‍යම සංස්කෘතික අරමුදල - ගාල්ල	2018.02.06
7	මාර්ග සංවර්ධන අධිකාරිය - ගාල්ල	2018.02.06
8	දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය	2018.02.06
9	ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු අධිකාරිය	2018.02.08
10	දේශීය ආදායම් ප්‍රාදේශීය කාර්යාලය - ගාල්ල	2018.02.08
11	ඉඩම් නිරවුල් කිරීමේ ප්‍රාදේශීය කාර්යාලය -ගාල්ල	2018.02.08
12	දේශීය ආදායම් දෙපාර්තමේන්තුව	2018.03.06
13	තැපැල් දෙපාර්තමේන්තුව	2018.03.08
14	සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව	2018.03.09
15	මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව	2018.03.15
16	මාර්ග සංවර්ධන අධිකාරිය - මූලස්ථානය	2018.03.16
17	ලංකා විදුලිබල මණ්ඩලය	2018.03.20
18	ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය	2018.03.23
19	කම්කරු දෙපාර්තමේන්තුව	2018.04.03
20	ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව	2018.04.05
21	.රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව	2018.04.06
22	සමාජ ආරක්ෂණ මණ්ඩලය	2018.04.20
23	ගමනාගමන මණ්ඩලය	2018.04.23
24	බන්ධනාගාර දෙපාර්තමේන්තුව	2018.04.24
25	ආගමන විගමන දෙපාර්තමේන්තුව	2018.04.26
26	සමාජ සේවා දෙපාර්තමේන්තුව	2018.05.15
27	ප්‍රාදේශීය සභාව - මාතලේ	2018.05.21
28	ගොවිජන දෙපාර්තමේන්තු ප්‍රාදේශීය කාර්යාලය - මාතලේ	2018.05.22
29	මහා නගර සභාව - මාතලේ	2018.05.22
30	පොල් සංවර්ධන මණ්ඩලය - මාතලේ	2018.05.22
31	තැපැල් කාර්යාලය- මාතලේ	2018.05.23
32	පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය - මාතලේ	2018.05.23
33	ලංකා විදුලිබල මණ්ඩල ප්‍රාදේශීය කාර්යාලය - මාතලේ	2018.05.23
34	දෙහිඕවිට ප්‍රාදේශීය සභාව	2018.06.05
35	දෙහිඕවිට ලංකා විදුලිබල මණ්ඩල ප්‍රාදේශීය කාර්යාලය	2018.06.05
36	දෙහිඕවිට ප්‍රාදේශීය විදුලිබල මණ්ඩල කාර්යාලය	2018.06.07
37	දෙහිඕවිට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය	2018.06.07
38	ප්‍රාදේශීය සභාව - බදුල්ල	2018.06.20
39	දේශීය ආදායම් ප්‍රාදේශීය කාර්යාලය - බදුල්ල	2018.06.20
40	ගොවිජන දෙපාර්තමේන්තු දිස්ත්‍රික් කාර්යාලය - බදුල්ල	2018.06.21
41	තැපැල් කාර්යාලය - කුරුණෑගල	2018.07.10
42	කලාප අධ්‍යාපන කාර්යාලය - කුරුණෑගල	2018.07.10
43	ප්‍රාදේශීය සභාව - කුරුණෑගල	2018.07.12
44	ප්‍රාදේශීය සභාව - වව්නියාව	2018.07.24
45	තැපැල් කාර්යාලය -වව්නියාව	2018.07.25
46	කලාප අධ්‍යාපන කාර්යාලය - වව්නියාව	2018.07.24

47	නගර සභාව - වව්නියාව	2018.07.24
48	ආගමන විගමන දිස්ත්‍රික් කාර්යාලය - වව්නියාව	2018.07.24
49	තැපැල් කාර්යාලය - කළුතර	2018.08.08
50	නගර සභාව - කළුතර	2018.08.08
51	ප්‍රාදේශීය සභාව - කළුතර	2018.08.10
52	කලාප අධ්‍යාපන කාර්යාලය - කළුතර	2018.08.10
53	මුහුදුබඩපත්තු ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - මුලතිව්	2018.08.28
54	ප්‍රාදේශීය සභාව - මුලතිව්	2018.08.28
55	ධර්මපුරම් පොලිස් ස්ථානය - මුලතිව්	2018.08.28
56	ඔඩ්ඩුසුඩාන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - මුලතිව්	2018.08.29
57	තැපැල් කාර්යාලය - මුලතිව්	2018.08.29
58	මල්ලාවි පොලිස් ස්ථානය - මුලතිව්	2018.08.29
59	දිස්ත්‍රික් ගොවිජන සංවර්ධන කාර්යාලය - රත්නපුර	2018.09.13
60	ප්‍රාදේශීය සභාව - රත්නපුර	2018.09.13
61	තැපැල් කාර්යාලය - රත්නපුර	2018.09.13
62	.මහනගර සභාව - රත්නපුර	2018.09.14
63	දේශීය ආදායම් ප්‍රාදේශීය කාර්යාලය - රත්නපුර	2018.09.14
64	ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය - රත්නපුර	2018.09.14
65	වාලච්චේනෙයි පොලිස් ස්ථානය-මඩකලපුව	2018.09.19
66	කාත්තාන්කුඩි පොලිස් ස්ථානය - මඩකලපුව	2018.09.19
67	ප්‍රාදේශීය සභාව - මඩකලපුව	2018.09.20
68	දිස්ත්‍රික් කම්කරු කාර්යාලය-මන්නාරම	2018.10.09
69	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය-මන්නාරම	2018.10.09
70	තැපැල් කාර්යාලය-මන්නාරම	2018.10.10
71	ප්‍රාදේශීය සභාව-මන්නාරම	2018.10.10
72	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය-මාවනැල්ල	2018.10.17
73	ප්‍රාදේශීය සභාව-මාවනැල්ල	2018.10.17
74	ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තු දිස්ත්‍රික් කාාර්යාලය- කෑගල්ල	2018.10.17
75	සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය-කෑගල්ල	2018.10.18
76	නගර සභාව-කෑගල්ල	2018.10.19
77	දිස්ත්‍රික් කම්කරු කාර්යාලය-ත්‍රිකුණාමලය	2018.11.14
78	මහනගර සභාව-ත්‍රිකුණාමලය	2018.11.14
79	ප්‍රාදේශීය සභාව-ත්‍රිකුණාමලය	2018.11.14
80	සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය-ත්‍රිකුණාමලය	2018.11.15
81	තැපැල් කාර්යාලය-ත්‍රිකුණාමලය	2018.11.15
82	මහනගර සභාව-අනුරාධපුරය	2018.11.28
83	මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව-අනුරාධපුරය	2018.11.28
84	ප්‍රාදේශීය සභාව-මිහින්තලය	2018.11.29
85	දිස්ත්‍රික් කම්කරු කාර්යාලය-අනුරාධපුරය	2018.11.29
86	තැපැල් කාර්යාලය-අනුරාධපුරය	2018.11.29
87	සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය-අනුරාධපුරය	2018.11.29
88	තැපැල් කාර්යාලය-යාපනය	2018.12.11
89	පොලිස් ස්ථානය-කන්කසන්තුරේ	2018.12.11
90	දිස්ත්‍රික් කම්කරු කාර්යාලය-යාපනය	2018.12.11
91	ප්‍රාදේශීය සභාව-නල්ලූර්	2018.12.12
92	මහනගර සභාව-යාපනය	2018.12.12
93	සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය-යාපනය	2018.12.12
94	ප්‍රාදේශීය සභාව- කයිට්ස්	2018.12.12
95	ප්‍රාදේශීය සභාව- මානිප්පායි	2018.12.13
96	පොලිස් ස්ථානය-කයිට්ස්	2018.12.13

මීට අමතරව මෙම වර්ෂය තුළ දුම්රිය ස්ථානවල ද භාෂා විගණන සිදු කරන ලදි. ඒ අනුව,

ස්ථානය	දිනය
1.ගම්පහ දුම්රිය ස්ථානය	2018.01.24
2.වවුනියාව - දකුණු දුම්රිය ස්ථානය	2018.02.11
3. අනුරාධපුරය නව නගරය දුම්රිය ස්ථානය	2018.02.12
4. ගාල්ල දුම්රිය ස්ථානය	2018.02.20
5. කළුතර දුම්රිය ස්ථානය	2018.03.13
6. පොල්ගහවෙල දුම්රිය ස්ථානය	2018.05.08
7. හලාවත දුම්රිය ස්ථානය	2018.06.26
8.කුරුණෑගල දුම්රිය ස්ථානය	2018.07.04
9.ගල්කිස්ස දුම්රිය ස්ථානය	2018.07.05
10.කිලිනොච්චි දුම්රිය ස්ථානය	2018.08.30
11.මඩකලපුව දුම්රිය ස්ථානය	2018.09.19
12.අවිස්සාවේල්ල දුම්රිය ස්ථානය	2018.10.05
13.ත්‍රිකුණාමලය දුම්රිය ස්ථානය	2018.11.15
14.යාපනය දුම්රිය ස්ථානය	2018.12.13



ගාල්ල මාර්ගස්ථ මගීප්‍රවාහන අධිකාරිය



කළුතර නගර සභාව



මාවනැල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

(07) භාෂා කව

භාෂා අධ්‍යාපනය පාසල් දරුවන් වෙත ලබා දීම දිගු කාලීන ක්‍රියාවලියක ආරම්භයකි. එබැවින් රාජ්‍ය භාෂා කොමිෂන් සභාව විසින් අධ්‍යාපන අමාත්‍යාංශය හරහා පාසල් තුළ භාෂා කව පිහිටුවීම සඳහා චක්‍රලේඛයක් නිකුත් කරන ලදි. ඒ අනුව භාෂා කව පිහිටුවීම සඳහා පහසුකම් සැපයීමට වැඩසටහන් ක්‍රියාත්මක කිරීම රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ 2018 වාර්ෂික ක්‍රියාකාරී සැළැස්මට ඇතුළත් කර වැඩසටහන් 07ක් ගාල්ල, මාතලේ, බදුල්ල, ගම්පහ, මන්නාරම සහ කෑගල්ල යන දිස්ත්‍රික්කවල පවත්වන ලදි. මෙහිදී එම වැඩසටහන්වලට සහභාගී වූ පාසල්වල පුස්තකාල සඳහා රාජ්‍ය භාෂා කොමිෂන් සභාව විසින් පොත් කට්ටලය බැගින් ප්‍රදානය කරන ලදි.

	ස්ථානය	දිනය	සහභාගී වූ පාසැල් ගණන
1	ගාල්ල හෝල් ඩී ගොල් ශාලාවේ	2018.02.21	49
2	මාතලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය	2018.05.24	43
3	බදුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය	2018.06.21	46
4	ගම්පහ ප්‍රාදේශීය සභාව	2018.06.29	37
5	මන්මුනෙයි උතුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය	2018.09.20	50
6	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය-මන්නාරම	2018.10.11	23
7	ස්වර්ණ ජයන්ති විදුහල් ශ්‍රවණාගාරය.කෑගල්ල	2018.10.18	41



කෑගල්ල දිස්ත්‍රික්කය



ගාල්ල දිස්ත්‍රික්කය



මාතලේ දිස්ත්‍රික්කය



මඩකලපුව දිස්ත්‍රික්කය



මන්නාරම දිස්ත්‍රික්කය

(08) පැමිණිලි විමර්ෂණය.

රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය උල්ලංඝනය වීම සම්බන්ධයෙන් ලැබෙන මහජන පැමිණිලි විමර්ශනය සඳහා කොමිෂන් සභා පනත මගින් කොමිෂන් සභාව වෙත විශේෂිත බලතල හිමිවී ඇත. එවැනි පැමිණිලි විමර්ශනය කිරීම කොමිෂන් සභාවේ එක් ප්‍රධාන කාර්යයකි. කොමිෂන් සභාව වෙත මහජන පැමිණිලි පහත ආකාරයෙන් යොමු වේ.

01. ලිපි මගින්
02. කොමිෂන් සභාව වෙත පැමිණීමෙන්
03. මුද්‍රිත මාධ්‍යවල පල කරන පැමිණිලි
04. විද්‍යුත් තැපෑල
05. දුරකථන පණිවුඩ
06. අමාත්‍යාංශයේ 1956 ඇමතුම් මධ්‍යස්ථානය වෙත යොමු වන පැමිණිලි

සමාලෝචනය කරන ලද වර්ෂය තුළ කොමිෂන් සභාව වෙත පැමිණිලි 233 ඉදිරිපත් වී ඇත. මෙම පැමිණිලිවලින් 177ක විමර්ශන කටයුතු 2018 වර්ෂයේදී අවසන් කර ඇත. මෙම වර්ෂය තුළදී අවසන් කරන ලද විශේෂිත පැමිණිලි කිහිපයක් පහත වගුවේ දැක්වේ.

වගුව 3

පැමිණිල්ල	ගත් ක්‍රියා මාර්ග
මාර්ග සංවර්ධන අධිකාරියට අයත් කිරිබත්කුඹුරේ පිහිටි මහාමාර්ග කෞතුකාගාර සංකීර්ණයේ මහජන ප්‍රදර්ශිත ප්‍රධාන නාම පුවරුවේ සඳහන් කර ඇති " මහාමාර්ග කෞතුකාගාර සංකීර්ණය " යන්නෙහි දෙමළ භාෂා පරිවර්තනය නිවැරදි නොවන බව	මේ සම්බන්ධයෙන් මාර්ග සංවර්ධන අධිකාරියේ මධ්‍යම පළාත් භාර අධ්‍යක්ෂ විසින් දන්වා ඇත්තේ අදාල නාම පුවරුවේ දෙමළ භාෂා අක්ෂර නිවැරදි කර සකස් කළ බවයි.
කොළඹ මහ නගර සභා බල ප්‍රදේශය තුල මහජන ප්‍රදර්ශනය කර ඇති " සී ස්ට්‍රීට් " (SEA STREET) යන නාම පුවරුවෙහි සිංහල භාෂා හා දෙමළ භාෂා පරිවර්තනය නිවැරදි නොවන බව	මේ සම්බන්ධයෙන් නාගරික කොමසාරිස් වෙතින් නිරීක්ෂණ කැඳවන ලදී. අදාල නාම පුවරුව නිවැරදි කර ඇති බවට ඡායාරූපයක් සහිතව කොමිෂන් සභාව වෙත වාර්තා කර ඇත.
පුරාවස්තු ආරක්ෂණ කොට්ඨාසය තුල මහජන ප්‍රදර්ශනය කර ඇති ප්‍රධාන නාම පුවරුවේ " පුරාවස්තු ආරක්ෂණ කොට්ඨාසය " යන නාම පුවරුවෙහි සිංහල භාෂාවෙන් " කොට්ඨාශය " හා "හදිසි ඇමතුම්" යන්නෙහි දෙමළ භාෂා පරිවර්තනය නිවැරදි නොවන බව	මේ සම්බන්ධයෙන් එම කොට්ඨාසයේ ස්ථානාධිපති විසින් දන්වා ඇත්තේ, අදාල නාම පුවරුව අලුත් වැඩියා කරන ලෙස පුරා විද්‍යා අධ්‍යක්ෂ වෙතින් ඉල්ලා ඇති බවයි. මේවනවිට නාම පුවරුව නිවැරදි කර ඇත.
උතුරු කොළඹ ශික්ෂණ රෝහලට අයත් ගිලන් රථයෙහි මහජන ප්‍රදර්ශනය කර ඇති "උතුරු කොළඹ ශික්ෂණ රෝහල - රාගම " යන ආයතන නාමයෙහි දෙමළ භාෂා පරිවර්තනය නිවැරදි නොවන බව	මේ සම්බන්ධයෙන් අධ්‍යක්ෂ විසින් දන්වා ඇත්තේ, අදාල රෝහල් නාමය නිවැරදිව සකස් කර ඇති බවයි.

සතොස සමාගම මඟින් අලෙවි කරනු ලබන සුදු සීනි කිලෝ ග්‍රෑම් 01 ඇසුරුමෙහි සඳහන් ‘‘සුදු සීනි’’ යන්නෙහි දෙමළ භාෂා පරිවර්තනය නිවැරදි නොවන බව	මේ සම්බන්ධයෙන් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - අලෙවි විසින් දන්වා ඇත්තේ, අදාල දෙමළ භාෂා පරිවර්තනය නිවැරදි කර ඇති බවයි.
මීගමුව මහා නගර සභාවට අයත් ලොරි රථයක සඳහන් “මීගමුව මහා නගර සභාව” යන ආයතන නාමයෙහි දෙමළ භාෂා පරිවර්තනය නිවැරදි නොවන බව	මේ සම්බන්ධයෙන් නාගරික කොමසාරිස් වෙතින් නිරීක්ෂණ කැඳවන ලදී. අදාල නාම පුවරුව නිවැරදි කර ඇති බවට ඡායාරූපයක් සහිතව කොමිෂන් සභාව වෙත වාර්තා කර ඇත.
මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ අයදුම්පත් භාර ගැනීමේ අංශයෙහි මහජන ප්‍රදර්ශිත නාම පුවරුවේ දෙමළ භාෂා පරිවර්තනය නිවැරදි නොවන බව හා එහි ප්‍රදර්ශිත දැන්වීම හා මෝටර් රථ වාහන අයිතිය පැවරීමේදී අය කරනු ලබන ගාස්තු සඳහන් දැන්වීම් පුවරුද සිංහල භාෂාවෙන් පමණක් බව	මේ සම්බන්ධයෙන් කොමසාරිස් ජනරාල් වෙතින් නිරීක්ෂණ කැඳවන ලදී. අදාළ පුවරුව ජනශක්ති ආයතනයේ අනුග්‍රහයෙන් ලබා දුන් එකක් බවත්, එහි දෙමළ මාධ්‍ය පුවරුවක් ලබා දෙන ලෙස ඔවුන් ඉල්ලීම් කර ඇති බවත් එහි කොමසාරිස් - පාලන විසින් දන්වා ඇත.
නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශයේ හා ජාතික වෘත්තීය පුහුණු අධිකාරියේ වෙබ් අඩවිවල සඳහන් වන තොරතුරු ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් ඇති බව	මේ සම්බන්ධයෙන් ලේකම් හා සභාපති වෙතින් නිරීක්ෂණ කැඳවන ලදී. අදාල වෙබ් අඩවි ත්‍රෛභාෂාවෙන්ම නිර්මාණය කිරීමට අවශ්‍ය කටයුතු දැනටමත් සිදු කරන බව දන්වා ඇත.
තැපැල් දෙපාර්තමේන්තුව විසින් මහජනයා වෙත යවනු ලබන අධිවේගී තැපැල් සේවාවේදී යොදා ගනු ලබන ලිපි ලේඛන අඩංගු කවරයන්හි Sri Lanka Courier යනුවෙන් ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සඳහන් කර ඇති බව	මේ සම්බන්ධයෙන් තැපැල්පති වෙතින් නිරීක්ෂණ කැඳවන ලදී. අදාළ කවර සඳහා භාෂාත්‍රයෙන් සකස් කළ රබර් මුද්‍රවක් භාවිත කරන බව නියෝජ්‍ය තැපැල්පති -මෙහෙයුම් විසින් දන්වා ඇත.
රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවට අයත් බස් නැවතුම්පොළ අසල ස්ථාන ගත කර ඇති නාම පුවරුවෙහි ‘‘කරවනැල්ල මධ්‍යම බස් නැවතුම් පොළ’’ යන්නෙහි දෙමළ භාෂා පරිවර්තනය නිවැරදි නොවන බව	මේ සම්බන්ධයෙන් සබරගමුව මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ සාමාන්‍යාධිකාරී වෙතින් නිරීක්ෂණ කැඳවන ලදී. නාම පුවරුව නිවැරදි කර ඇත.
මාර්ග සංවර්ධන අධිකාරියට අයත්, 1) සීතාවක අධිකරණ මංසන්ධිය අසල ස්ථාන ගත කර ඇති මාර්ග නාම පුවරුවෙහි ‘‘මාළිගා මාවත’’ යන්නෙහි දෙමළ භාෂා පරිවර්තනය නිවැරදි නොවන බව හා 2) කරවනැල්ල නගර මධ්‍යයේ ස්ථාන ගත කර ඇති කොළ පැහැති මාර්ග නාම පුවරුවේ ‘‘ කෑගල්ල’’ යන්නෙහි දෙමළ භාෂා පරිවර්තනය නිවැරදි නොවන බව	මේ සම්බන්ධයෙන් පළාත් ඉංජිනේරු වෙතින් හා සීතාවකපුර නගර සභාවේ ලේකම් වෙතින් නිරීක්ෂණ කැඳවන ලදී. අදාළ නාම පුවරු නිවැරදි කර ඇති බව එම ප්‍රධානීන් විසින් දන්වා ඇත.
බදුල්ල මහා නගර සභාවට අයත්, 1) ගිනි නිවන ඒකකය සතු වාහනවල Fire and rescue යනුවෙන් ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සඳහන් කර ඇති බව හා 2) කැලි කසල ඉවත් කිරීමට යොදා ගන්නා ට්‍රැක්ටර් රථවල Municipal Council යන්න කෙටි යෙදුමක් බවට පත් කොට MC ලෙස යොදා එය ද්‍රවිඩ භාෂාවෙන්ද අර්ථ විරහිතව දක්වා ඇති බව	මේ සම්බන්ධයෙන් නාගරික කොමසාරිස් වෙතින් නිරීක්ෂණ කැඳවන ලදී. නාගරික ඉංජිනේරු විසින් දන්වා ඇත්තේ, අදාල වාහනවල ආයතන නාමය භාෂාත්‍රයෙන්ම සඳහන් කර ප්‍රදර්ශනය කිරීමට කටයුතු කරන බවයි.

බන්ධනාගාර දෙපාර්තමේන්තුවට අයත් නිලධාරීන්ගේ නිල ඇඳුමෙහි ඇති නිල ලාංඡනයේ “ ශ්‍රී ලංකා බන්ධනාගාරය “ යනුවෙන් සිංහල භාෂාවෙන් පමණක් සඳහන් කර ඇති බව	මේ සම්බන්ධයෙන් කොමසාරිස් ජනරාල් විසින් දන්වා ඇත්තේ, අදාළ නිල ඇඳුමෙහි නිල ලාංඡනය භාෂාත්‍රයෙන්ම සකස් කර ඇති බවයි.
හංවැල්ල ප්‍රාදේශීය සභාවට අයත් පොදු සුසාන භූමියෙහි ප්‍රදර්ශිත නාමපුවරුවෙහි “පොදු සුසාන භූමිය” යන්නෙහි දෙමළ භාෂා පරිවර්තනය නිවැරදි නොවන බව	මේ සම්බන්ධයෙන් ලේකම් වෙතින් නිරීක්ෂණ කැඳවන ලදී. අදාළ නාම පුවරුවෙහි දෙමළ භාෂා පරිවර්තනය නිවැරදි කිරීමට කටයුතු කළ බව දන්වා ඇත.
කඩුවෙල මහා නගර සභාවට අයත් ප්‍රධාන බස් නැවතුම් පොළෙහි මහජන ප්‍රදර්ශිත නාමපුවරුවෙහි “ කඩුවෙල බස් නැවතුම් සංකීර්ණය ” යන්නෙහි දෙමළ භාෂා පරිවර්තනය නිවැරදි නොවන බව .	මේ සම්බන්ධයෙන් නාගරික කොමසාරිස් වෙතින් නිරීක්ෂණ කැඳවන ලදී. අදාල නාම පුවරුවේ අක්ෂර දෝෂ නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා ඇත.
සීතාවක නගර සභාව මඟින් පාලනය වන රථ ගාලෙහි වාහන සඳහා ලබා දෙනු ලබන බිල් පත සිංහල භාෂාවෙන් පමණක් බව	මේ සම්බන්ධයෙන් ලේකම් වෙතින් නිරීක්ෂණ කැඳවන ලදී. අදාල බිල් පත් මුද්‍රිත ප්‍රමාණය අවසන් වූ පසු භාෂාත්‍රයෙන්ම එම බිල්පත් මුද්‍රණය කරන බව දන්වා ඇත.
ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් මහරගම, කෑගල්ල හා අලව්ව යන ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩල ඩිපෝ වලට අයත් බස් රථවල මහජන ප්‍රදර්ශිත ගමනාන්ත නාම පුවරු සිංහල භාෂාවෙන් පමණක් බව	මේ සම්බන්ධයෙන් සභාපති වෙතින් නිරීක්ෂණ කැඳවන ලදී. එහි නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී විසින් දන්වා ඇත්තේ, කොළඹ/ වයඹ/ සබරගමුව ප්‍රාදේශීය කළමණාකාරුවන් වෙත අදාල බස් රථවල නාම පුවරු භාෂාත්‍රයෙන්ම සකස් කරන ලෙස උපදෙස් දී ඇති බවයි.
සබරගමුව පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියට අයත් දෙහිඕවිට සිට ඇහැළියගොඩ දක්වා ගමන් කරන SGNA -4496 දරන බස් රථයේ මහජන ප්‍රදර්ශිත ගමනාන්ත නාම පුවරුව සිංහල භාෂාවෙන් පමණක් බව	මේ සම්බන්ධයෙන් සබරගමුව මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ සාමාන්‍යාධිකාරි වෙතින් නිරීක්ෂණ කැඳවන ලදී. අදාල බස් රථයේ නාම පුවරුව භාෂාත්‍රයෙන්ම සකස් කර ඇති බව දන්වා ඇත.
ශ්‍රී ලංකා විදුලි බල මණ්ඩලයට අයත් SGZA -2837 දරන රථයේ මහජන ප්‍රදර්ශිත ආයතන නාමය Chief Engineers Sabaragamuwa ලෙස ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සඳහන් කර ඇති බව	මේ සම්බන්ධයෙන් විදුලි ඉංජිනේරු වෙතින් නිරීක්ෂණ කැඳවන ලදී. එම වාහනවල ආයතන නාමය භාෂාත්‍රයෙන්ම සකස් කිරීමට අවශ්‍ය කටයුතු කර ඇති බව දන්වා ඇත.
නයිවල ඩ්‍රීම් පැරඩයිස් සතුටු උයනට පැමිණෙන නරඹන්නන් හට නිකුත් කරනු ලබන ඇතුළත් වීමේ ප්‍රවේශපත්‍රය සිංහල භාෂාවෙන් පමණක් බව හා එම උද්‍යානය තුළ මහජන ප්‍රදර්ශිත නාම පුවරු හා තොරතුරු පුවරු සිංහල භාෂාවෙන් පමණක් සඳහන් කර ඇති බව	මේ සම්බන්ධයෙන් ආයතන කළමණාකරු වෙතින් නිරීක්ෂණ කැඳවන ලදී. අදාල නාම පුවරු භාෂා පරිවර්තනය සඳහා අවශ්‍ය සහයෝගය ඉල්ලා තිබූ අතර ඒ අනුව රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තු භාෂා පරිවර්තක සංචිතයේ සහයෝගය ලබා ගැනීමට කටයුතු කරන ලෙස කොමිෂන් සභාව විසින් දන්වා යැවිය.

නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය මඟින් නිවාස සංවර්ධන අධිකාරිය හා එක්ව හම්බන්තොට ප්‍රදේශයේ ක්‍රියාත්මක කරනු ලැබූ " ගම් උදාව " නිවාස ව්‍යාපෘතියේ ගම් උදාව යන්න දෙමළ භාෂාවෙන් ඒ ආකාරයෙන්ම යොදා තිබූ බව හා, එම ව්‍යාපෘතියට සමගාමීව ක්‍රියාත්මක වන "ශිල්ප සවිය " හා " සැමට සෙවන " යන ව්‍යාපෘති නාමයන්ද දෙමළ භාෂාවෙන් ඒ ආකාරයෙන්ම යොදා තිබූ බවත්, ඒවා දෙමළ භාෂාවෙන් පරිවර්තනය කොට සඳහන් කළ යුතු බව	මේ සම්බන්ධයෙන් ලේකම් වෙතින් නිරීක්ෂණ කැඳවන ලදී. " ගම් උදාව " සන්නාම නාමය ත්‍රෙභාෂාවෙන්ම භාවිතා කරන බවත්, " සැමට සෙවන " සන්නාම නාමය ත්‍රෙභාෂාවෙන්ම ඔවුන් වෙත නොමැති බව දන්වා ඇත. එම සන්නාම නාමයද රාජ්‍ය භාෂා දෙපාර්තමේනතුව වෙතින් අවශ්‍ය සහයෝගය ලබා ගනිමින් පරිවර්තනය කරන ගන්නා ලෙස දන්වා යවා ඇත.
කොළඹ මහා නගර සභාව මඟින් නිකුත් කරනු ලබන වාහන නැවතුම් ගාස්තු පත සිංහල හා ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් බව හා ඇතැම් නාම පුවරු සිංහල භාෂාවෙන් පමණක් වන බව	මේ සම්බන්ධයෙන් නාගරික කොමසාරිස් වෙතින් නිරීක්ෂණ කැඳවන ලදී. එහි අධ්‍යක්ෂ - ඉංජිනේරු විසින් දන්වා ඇත්තේ, වාහන නැවතුම් ගාස්තු පත ත්‍රෙභාෂාවෙන්ම සකසා ඇති බවත්, අදාළ දැන්වීම් පුවරුද ත්‍රෙභාෂාවෙන්ම සැකසීමට කටයුතු දැනටමත් සිදු කර ඇති බවයි.
සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය මගින් වැල්ලවත්ත මුහුදු තීරය අසල සවිකර ඇති දැන්වීම් පුවරුව සිංහල භාෂාවෙන් පමණක් බව	මේ සම්බන්ධයෙන් සභාපති වෙතින් නිරීක්ෂණ කැඳවන ලදී. අදාළ නාම පුවරුව ත්‍රෙභාෂාවෙන්ම සකස් කර ඇති බව දන්වා ඇත.
කොටිකාවත්ත මහජන බැංකු ශාඛාවේ මහජන ප්‍රදර්ශිත ඇතැම් දැන්වීම් පුවරු සිංහල භාෂාවෙන් පමණක් බව	මේ සම්බන්ධයෙන් ශාඛා කළමනාකරු වෙතින් නිරීක්ෂණ කැඳවන ලදී. අදාල දැන්වීම් පුවරුව ත්‍රෙභාෂාවෙන්ම සකස් කරන බව දන්වා ඇත.
රූපවාහිනී සංස්ථාවේ නිවාඩු ඉල්ලුම් පත්‍රය සිංහල භාෂාවෙන් පමණක් බව හා වැඩසටහන් සඳහා බාහිර ශිල්පීන්ගේ සහභාගීත්වය සනාථ කිරීමේ පොරමය සිංහල භාෂාවෙන් පමණක් බව	මේ සම්බන්ධයෙන් අධ්‍යක්ෂ ජනරාල් වෙතින් නිරීක්ෂණ කැඳවන ලදී. අදාළ නිවාඩු ඉල්ලුම් පත්‍රය හා පෝමය ත්‍රෙභාෂාවෙන්ම සකස් කර ඇති බව දන්වා ඇත.
පොලිස් දෙපාර්තමේන්තුවේ, නිල වෙබ් අඩවියේ තොරතුරු දෙමළ භාෂාවෙන් සඳහන් නොවන බව හා රථ වාහන පොලිසියට අයත් ඇතැම් නාම පුවරු සිංහල භාෂාවෙන් පමණක් බව	මේ සම්බන්ධයෙන් පොලිස්පති වෙතින් නිරීක්ෂණ කැඳවන ලදී. අදාළ නිල වෙබ් අඩවියට අවශ්‍ය තොරතුරු ත්‍රෙභාෂාවෙන්ම සකස් කර නැවත එම වෙබ් අඩවිය ප්‍රතිව්‍යුහ ගත කිරීමට කටයුතු කරන බව දන්වා ඇත.
මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවට අයත් මහජන ප්‍රදර්ශිත ප්‍රධාන නාම පුවරුව සිංහල භාෂාවෙන් පමණක් බව	මේ සම්බන්ධයෙන් සභාපති වෙතින් නිරීක්ෂණ කැඳවන ලදී. අදාළ නාම පුවරුව ත්‍රෙභාෂාවෙන්ම සකස් කර ඇති බව දන්වා ඇත.
ශ්‍රී ලංකා ජාතික වාණිජ මණ්ඩලයට අයත් මහජන ප්‍රදර්ශිත ප්‍රධාන නාම පුවරුව ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් බව	මේ සම්බන්ධයෙන් සභාපති වෙතින් නිරීක්ෂණ කැඳවන ලදී. අදාළ ආයතනය සමාගම් පනතේ ලියාපදිංචි වූ ආයතනයක් වන හෙයින් මෙම පැමිණිල්ලේ ඉදිරි විමර්ශනය කටයුතු සිදු කළ නොහැක.
මරදාන පොලිස් ස්ථානය මගින් කොළඹ ජාතික රෝහල අවට මහජන ප්‍රදර්ශනය කර ඇති ඇතැම් නාම පුවරු සිංහල භාෂාවෙන් පමණක් බව	මේ සම්බන්ධයෙන් මරදාන පොලිස් ස්ථානාධිපති වෙතින් නිරීක්ෂණ කැඳවන ලදී. එම දැන්වීම් පුවරු ත්‍රෙභාෂාවෙන්ම ප්‍රදර්ශනය කරන ලෙස අදාළ අනුග්‍රාහක ආයතනය වෙත දන්වා ඇති බවට කොමිෂන් සභාව වෙත වාර්තා කර ඇත.

ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක අධ්‍යයන ආයතනය මගින් නිකුත් කරනු ලබන ත්‍රෛමාසික සඟරාව ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් බව	මේ සම්බන්ධයෙන් අධ්‍යක්ෂ ජනරාල් වෙතින් නිරීක්ෂණ කැඳවන ලදී. අදාල සඟරාව භාෂාත්‍රයෙන්ම නිකුත් කිරීමට කටයුතු කර ඇති බව දන්වා ඇත.
අවිස්සාවේල්ල ඩිපෝවට අයත් අංක WP NC – 0100 හා SGHH – 4340 බස්රථවල ගමනාන්ත නාම පුවරු සිංහල භාෂාවෙන් පමණක් බව	මේ සම්බන්ධයෙන් ඩිපෝ කළමණාකරු වෙතින් නිරීක්ෂණ කැඳවන ලදී.එම ඩිපෝවට අයත් WP NC – 0100 රථයේ නාම පුවරුව ත්‍රෛභාෂාවෙන් සකස් කර ඇති බව දන්වා ඇත.
අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් පසුගිය ඔක්තෝබර් මස පවත්වන්නට යෙදුණු " තිරදර්ශී " නමින් නම් කෙරුණු අධ්‍යාපනික ප්‍රදර්ශනයේ ප්‍රධාන නාම පුවරුව හා ඒ පිළිබඳ පුවත්පත් වාර්තා සිංහල භාෂාවෙන් පමණක් බව	මේ සම්බන්ධයෙන් ලේකම් වෙතින් නිරීක්ෂණ කැඳවන ලදී. එහි ආරාධනා පත්‍රද ද්වි භාෂාවෙන් නිකුත් කළ බව දන්වා ඇත.
මාතලේ කලාප අධ්‍යාපන කාර්යාලය මඟින් පසුගිය ඔක්තෝබර් මස මාතලේ දිස්ත්‍රික්කයේ පවත්වන්නට යෙදුණු " ගුරු ප්‍රණාම" උපහාර උළෙල පිළිබඳව ප්‍රදේශය පුරා ප්‍රදර්ශනය කෙරුණු බැනර්, ආරාධිත අමුත්තන් වෙත යැවුණු ආරාධනා පත්‍ර සියල්ල සිංහල භාෂාවෙන් පමණක් බව	මේ සම්බන්ධයෙන් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් හා මාතලේ දිස්ත්‍රික් ලේකම් විසින් දන්වා ඇත්තේ, ආරාධනා පත්‍ර , සහතික ආදිය ද්වි භාෂාවෙන්ම නිකුත් කළ බවයි.
කොටිකාවත්ත මහජන බැංකුවට අයත් මහජන ප්‍රදර්ශිත " භාණ්ඩ බෙදා හැරීමේ අංගනය " නැමැති නාම පුවරුව සිංහල භාෂාවෙන් පමණක් බව	මේ සම්බන්ධයෙන් ශාඛා කළමණාකරු වෙතින් නිරීක්ෂණ කැඳවා ලිපියක් යවා ඇත. අදාල නාම පුවරුව ත්‍රෛභාෂාවෙන්ම ප්‍රදර්ශනය කරන බව දන්වා ඇත.
නිමාව කොලොන්නාව ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට අයත් මහජන ප්‍රදර්ශිත " නිමාව කොලොන්නාව " නැමැති නාම පුවරුව සිංහල භාෂාවෙන් පමණක් බව	මේ සම්බන්ධයෙන් කළමණාකරු වෙතින් නිරීක්ෂණ කැඳවා ලිපියක් යවා ඇත. එම නාම පුවරුව ත්‍රෛභාෂාවෙන්ම ඇති බව දන්වා ඇත.
ශ්‍රී ලංකා රේගුවට අයත් වැල්ලම්පිටිය ගුවන් පාලම අසල ඇති කන්ටේනර් බහාලන ස්ථානයේ මහජන ප්‍රදර්ශිත "ශ්‍රී ලංකා රේගුව " නැමැති නාම පුවරුවේ දෙමළ භාෂා පරිවර්තනය නිවැරදි නොවන බව	මේ සම්බන්ධයෙන් අධ්‍යක්ෂ ජනරාල් වෙතින් නිරීක්ෂණ කැඳවා ලිපියක් යවා ඇත. නාම පුවරුව නිවැරදි කර ඇත.
දෙහිඕවිට ප්‍රාදේශීය සභාව මගින් නිකුත් කරනු ලබන 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත හා සම්බන්ධ බලපත්‍රයට අදාල 23 (ආ) වගන්ති සම්පූර්ණයෙන්ම සිංහල භාෂාවෙන් පමණක් බව	මේ සම්බන්ධයෙන් මධ්‍යම පරිසර අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් වෙතින් නිරීක්ෂණ කැඳවා ලිපියක් යවා ඇත. එම අධිකාරියේ ජාතික පාරිසරික පනතට අදාළ සියලු බලපත්‍ර භාෂාත්‍රයෙන්ම සැකසීමට ක්‍රමවේදයක් සකස් කර ඇති බවත් ඒ අනුව අදාළ ප්‍රධානීන් දැනුවත් කර ඇති බවත් දන්වා ඇත.
ආපදා කළමණාකරණ අමාත්‍යාංශයේ නුවරඑළිය කාර්යාලය මඟින් පසුගිය දිනක පවත්වනු ලැබූ මාධ්‍ය නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහනකදී එම නිලධාරීන් උදෙසා ලබා දුන් අත් පත්‍රිකා, පොත් පත් ආදී සියලු දේ සිංහල භාෂාවෙන් පමණක් බව	මේ සම්බන්ධයෙන් ලේකම් විසින් දන්වා ඇත්තේ, ආපදා සම්බන්ධයෙන් මහජනතාව දැනුවත් කිරීම සඳහා අත්පත්‍රිකා භාෂාත්‍රයෙන්ම මුද්‍රණය කරන බවයි.

සීතාවකපුර නගර සභාව මඟින් පාලනය වන කසල කළමනාකරණ මධ්‍යස්ථානය ඉදිරිපිට ස්ථාපිත මහජන ප්‍රදර්ශිත “ කසල ප්‍රතිශක්ති කිරිමේ මධ්‍යස්ථානය හා පොහොර ව්‍යාපෘතිය “ නමැති නාම පුවරුව සිංහල භාෂාවෙන් පමණක් බව හා සීතාවකපුර පොදු පුස්තකාලය ඉදිරිපිට සවි කර ඇති නාම පුවරුවෙහි දෙමළ භාෂා පරිවර්තනයේ අක්ෂර දෝෂ පවතින බව	මේ සම්බන්ධයෙන් ලේකම් වෙතින් නිරීක්ෂණ කැඳවා ලිපියක් යවා ඇත. එම නාම පුවරු නිවැරදි කර ප්‍රදර්ශනය කිරීමට කටයුතු කරන බව දන්වා ඇත.
වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරනු ලබන අංක 451 දරන වන රක්ෂණ අධිකාරිය යටතේ ලී මඩුවක් පවත්වා ගෙන යාම සඳහා ලබා දෙනු ලබන ඉල්ලුම් පත්‍රය සම්පූර්ණයෙන්ම සිංහල භාෂාවෙන් පමණක් බව	මේ සම්බන්ධයෙන් කොමසාරිස් ජනරාල්,වෙතින් නිරීක්ෂණ කැඳවා ලිපියක් යවා ඇත. අදාල අයදුම්පත භාෂාත්‍රයෙන්ම සකස් කර ගැනීමට අවශ්‍ය පියවර ගෙන ඇති බව දන්වා ඇත.
මීගමුව සුරාබදු ස්ථානයේ මහජන ප්‍රදර්ශිත නාම පුවරු නිවැරදි නොවන බව.	මේ සම්බන්ධයෙන් ස්ථානාධිපති වෙතින් නිරීක්ෂණ කැඳවා ලිපියක් යවා ඇත. අදාල නාම පුවරුව නිවැරදි කර ඇති බව දන්වා ඇත.
ජාතික ඒකාබද්ධතා හා ප්‍රතිසංධාන අමාත්‍යාංශය මඟින් අතුරුදහන්වූ පුද්ගලයින් පිළිබඳව තොරතුරු ලබා ගැනීමේ අරමුණින් මාතර දිස්ත්‍රික්කයේ ග්‍රාම නිලධාරීන් මඟින් එම තොරතුරු ලබා ගැනීමට අදාලව ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සඳහන් අයදුම්පත් හා ඊට අදාල ලියවිල්ල මහජනතාව වෙත ලබා දී ඇති බව	මේ සම්බන්ධයෙන් අමාත්‍යාංශ ලේකම් වෙතින් නිරීක්ෂණ කැඳවා ලිපියක් යවා ඇත. අදාළ ලේඛනය භාෂාත්‍රයෙන්ම දිස්ත්‍රික් ලේකම්වරු වෙත නිකුත් කර ඇති බව දන්වා ඇත.
කල්මුණේ පොලිස් ස්ථානයේ රථ වාහන පොලිස් නිලධාරීන් දෙදෙනෙකු විසින් 2018.01.19 වන දින කල්මුණ නගර මාර්ගයේ රථ වාහනය ධාවනය කිරීමේදී දෙමළ භාෂාව පමණක් කතා කරන පුද්ගලයෙකු වෙත මාර්ග නීති කඩකරන ලදැයි දන්වා දෙනු ලැබූ අවසර පත්‍රය (එම්.ටී.ඒ. 37) සිංහල භාෂාවෙන් පමණක් බව	මේ සම්බන්ධයෙන් ස්ථානාධිපති වෙතින් නිරීක්ෂණ කැඳවා ලිපියක් යවා ඇත. මින් ඉදිරියට රථවාහන නීතිය ක්‍රියාත්මක කිරීම සඳහා නිලධාරීන් යෙදීමේදී දෙමළ භාෂාව ලිවීමට, කියවීමට හැකි අය යොදවන බව දන්වා ඇත.
රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලියේ බොහෝ තොරතුරු හා ඊට අදාල පෝරම ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් බව	මේ සම්බන්ධයෙන් සභාපති වෙතින් නිරීක්ෂණ කැඳවා ලිපියක් යවා ඇත. අදාළ ලේඛන රාජ්‍ය භාෂා වලින්ම නිකුත් කිරීමට කටයුතු සම්පාදනය කරන බව දන්වා ඇත.
ශ්‍රී ලංකා ජාතික ලේ දීමේ සේවය මඟින් පුද්ගලයින් පිළිබඳව තොරතුරු ලබා ගැනීමේ අරමුණින් මහජනතාව වෙත ලබා දී ඇති රුධිර දායක ප්‍රකාශය හා වාර්තාව සිංහල භාෂාවෙන් පමණක් බව	මේ සම්බන්ධයෙන් ජාතික ලේ ආයතනයේ අධ්‍යක්ෂ වෙතින් නිරීක්ෂණ කැඳවා ලිපියක් යවා ඇත. අදාළ ප්‍රකාශය භාෂාත්‍රෙයන්ම මුද්‍රණය කර ඇති බව දන්වා ඇත.
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය හා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය යටතට අයත් උතුරු පළාත්වල දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල වැටුප් ලේඛන ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් නිකුත් කරන බව	මේ සම්බන්ධයෙන් මහා භාණ්ඩාගාර ලේකම් වෙතින් නිරීක්ෂණ කැඳවා ලිපියක් යවා ඇත. රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල් දන්වා ඇත්තේ, මෙම වැටුප් පත්‍රිකා නව පරිගණක වැඩසටහනක් යටතේ භාෂාත්‍රෙයන්ම ක්‍රියාත්මක කිරීමට පහසුකම් සලසා ඇති බවයි.
සියඹලාණ්ඩුව කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයට අයත් ප්‍රධාන ලිපි ශීර්ෂයෙහි ‘‘කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය - සියඹලාණ්ඩුව’’ යන්නෙහි දෙමළ භාෂා පරිවර්තනය නිවැරදි නොවන බව	මේ සම්බන්ධයෙන් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙතින් නිරීක්ෂණ කැඳවා ලිපියක් යවා ඇත. අදාළ ලිපි ශීර්ෂය නිවැරදිව සකසා එවා ඇත.

කැලණිය විශ්ව විද්‍යාලයේ මානව ශාස්ත්‍ර පීඨයට අදාළ ශාස්ත්‍රපති උපාධි විභාග අයදුම්පත සිංහල භාෂාවෙන් පමණක් නිකුත් කරන බව	මේ සම්බන්ධයෙන් පශ්චාත් උපාධි අධ්‍යයන පීඨයේ පීඨාධිපති වෙතින් නිරීක්ෂණ කැඳවා ලිපියක් යවා ඇත. අදාළ අයදුම්පත සිංහල භාෂාවෙන්ද සකස් කර ඇති බව දන්වා ඇත.
කුරුණෑගල කලාප අධ්‍යාපන කාර්යාලයේ කාර්ය මණ්ඩලයේ දෙමළ භාෂාවෙන් ගනුදෙනු කිරීමට හැකියාව ඇති නිලධාරීන් නොමැති නිසා කාර්යාලය වෙත පැමිණෙන දෙමළ ජනයා අපහසුතාවයට පත් වන බව හා කාර්යාලයේ ඇතුළත සඳහන් කර ඇති විස්තර පුවරු, උපදෙස් පුවරු, නාම පුවරු හා දිශා පුවරු භාෂාත්‍රයෙන් නොමැති බව	මේ සම්බන්ධයෙන් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙතින් නිරීක්ෂණ කැඳවා ලිපියක් යවා ඇත. එම කාර්යාලයේ නාම පුවරු භාෂාත්‍රයෙන්ම ඇති බවත්, ගුරු පුහුණු වැඩසටහන් වලට අදාල ලිපි ද්වි භාෂාවෙන්ම යොමු කරන බවත් දන්වා ඇත.
සබරගමුව මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියට අයත් රුවන්වැල්ල බස් ඩිපෝවේ සිට පිටත්වන පෞද්ගලික බස් රථයන්හි ගමනාන්ත නාම පුවරුවෙහි “ රුවන්වැල්ල ” යන්නෙහි දෙමළ භාෂා පරිවර්තනය නිවැරදි නොවන බව	මේ සම්බන්ධයෙන් සාමාන්‍යාධිකාරි වෙතින් නිරීක්ෂණ කැඳවා ඇත. අදාළ නාම පුවරුව නිවැරදි කර ඇති බව දන්වා ඇත.
මාර්ග සංවර්ධන අධිකාරියට අයත් හපුතලේ සිට වැලිමඩ දක්වා වූ මාර්ගයේ සවිකර ඇති මාර්ග නාම පුවරුවෙහි “ බෙරගල ” යන්නෙහි දෙමළ භාෂා පරිවර්තනය නිවැරදි නොවන බව	මේ සම්බන්ධයෙන් පළාත්භාර අධ්‍යක්ෂ (ඌව)වෙතින් නිරීක්ෂණ කැඳවන ලදි. මෙවනවිට අදාළ නාම පුවරුව නිවැරදි කර ඇති බව දන්වා ඇත.



රාජ්‍ය භාෂා කොමිෂන් සභාව

මූල්‍ය ප්‍රකාශන - 2018

“ජනජයසිටි” ගොඩනැගිල්ල,
09 වන මහල,
නාවල පාර,
රාජගිරිය.

2018 දෙසැම්බර් මස 31 දිනට මූල්‍ය තත්ත්වය

වත්කම්	සටහන	2018	2017
ජංගම වත්කම්			
පරිලේඛන	**1**	569,020.00	773,815.00
කලින් ගෙවීම්	**2**	-	16,458.36
සේවකයින්ට ලබාදෙන ණය	**3**	2,924,712.08	2,994,621.54
ඉන්වෙන්ට්‍රි අයිතම		79,674.35	74,679.35
ලිපි ද්‍රව්‍ය (තොග)		391,100.96	420,050.36
උප අග්‍රිම පියවීම		179,030.75	181,458.75
මුදල් සහ මුදල් සමාන		1,618,950.30	71,519.56
විශේෂ අත්තිකාරම්		400.00	3,200.00
උත්සව අත්තිකාරම්		9,900.00	-
වෙනත් වත්කම්		374,400.00	-
		6,147,188.44	4,535,802.92
ජංගම නොවන වත්කම්			
දේපල යන්ත්‍රෝපකරණ සහ උපකරණ	4	**9,169,167.70**	**10,699,202.01**
මුළු වත්කම්		**15,316,356.14**	**15,235,004.93**
බැරකම්			
වර්තමාන බැරකම්			
ගෙවිය යුතු	5	207,378.05	1,860,835.38
විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන		470,094.00	594,714.00
		677,472.05	**2,455,549.38**
ජංගම නොවන බැරකම්			
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන	**6**	**3,048,268.40**	**2,655,923.40**
මුළු බැරකම්			
ශුද්ධ වත්කම්		**11,590,615.69**	**10,123,532.15**
ශුද්ධ වත්කම්/සම කොටස්			
සමුච්චිත අතිරික්තය/හිඟය	**7**	**11,590,615.69**	**10,123,532.15**

මෙයට අමුණා ඇති සටහන මෙම මූල්‍ය ප්‍රකාශනවල අඛණ්ඩ කොටසකි. වරහන් තුළ ඇති සංඛ්‍යාවලින් දක්වා ඇත්තේ අඩුකිරීම් ය.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කොට ඇත්තේ ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම් ප්‍රමිති සහ රජයේ මූල්‍ය රෙගුලාසි චක්‍රලේඛවලට අනුකූලව ය.

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම වෙනුවෙන් කොමිෂන් සභාව වගකියනු ලැබේ. කොමිෂන් සභාව උදෙසා සහ ඒ වෙනුවෙන් අත්සන් කරන ලදී.

.....	.....	.....
(සභාපති)	**(කොමිෂන් සභා සාමාජික)**	**ඩී.එම්.ඒ.එන්. දිසානායක**
		(ගණකාධිකාරී - වැඩබලන)

රාජ්‍ය භාෂා කොමිෂන් සභාව

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මුල්‍ය කාර්යසාධනය

	සටහන	2018	217
ආදයම්			
භාණ්ඩාගාරයෙන් ලැබුනු පුනරාවර්තන ප්‍රදානයන්		26,167,345.00	29,310,700.00
ආදායම		328,631.91	159,800.50
වෙනත් ආදායම්	8	111,908.25	102,028.65
මුළු ආදායම්			
වියදම්			
වැටුප්, වේතන සහ සේවකයින් සඳහා ප්‍රතිලාභ	9	13,573,047.64	15,842,684.74
සැපයුම් සහ පරිභෝජ්‍ය පාවිච්චි කිරීම්	10	1,832,435.01	1,361,893.38
ක්ෂය කිරීම්		2,625,393.69	2,774,232.66
අළුත්වැඩියා සහ නඩත්තු කිරීම්	11	2,613,766.42	8,263,51.83
උපයෝග සහ අනිකුත් සේවාවන්	12	814,457.41	3,267,350.90
අනිකුත් වියදම්	13	350,637.50	252,572.50
රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ වැඩසටහන්	14	5,024,611.50	4,210,674.25
විගණන ගාස්තු		150,000.00	150,000.00
මුළු වියදම්		26,984,349.17	36,122,923.26
කාලපරිච්ඡේදය සඳහා අතිරික්තය/හිඟය		(376,464.01)	(6,550,394.11)

මෙයට අමුණා ඇති සටහන් මෙම මුල්‍ය ප්‍රකාශනවල අඛණ්ඩ කොටසකි. වරහන් තුළ ඇති සංඛ්‍යාවලින් දක්වා ඇත්තේ අඩුකිරීම් ය.

රාජ්‍ය භාෂා කොමිෂන් සභාව
2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ශුද්ධ වත්කම්/ හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය

	භාණ්ඩාගාරයන් ලැබුනු ප්‍රතිපාදන	උපචිත අරමුදල්	වර්ෂය සඳහා අතිරික්තය / (හිඟය)	වෙනත්	එකතුව
2017.01.01 දිනට ආරම්භක ශේෂය		7,531,926.26			7,531,926.26
භාණ්ඩාගාරයෙන් ලැබූනු ප්‍රාග්ධන ප්‍රතිපාදන	2,400,000.00				2,400,000.00
2016 වර්ෂය සඳහා අතිරික්තය/ (හිඟය)			(6,550,394.11)		(6,550,394.11)
ජාතික භාෂා ව්‍යාපෘතියෙන් ලද පරිත්‍යාග				442,000.00	442,000.00
ප්‍රත්‍යාගණන ලාභය				6,300,000.00	6,300,000.00
2017 දෙසැම්බර් 31 දිනට ශේෂය	**2,400,000.00**	**7,531,926.26**	(6,550,394.11)	**6,742,000.00**	**10,123,532.15**
2018 ජනවාරි 01 දිනට ශේෂය		**10,123,532.15**			**10,123,532.15**
භාණ්ඩාගාරයෙන් ලැබූනු ප්‍රාග්ධන ප්‍රතිපාදන	2,800,000.00				2,800,000.00
පෙර වර්ෂයේ ගැළපීම්					
2018 වර්ෂයේ අතිරික්තය/ (ඌනතාවය)			(376,464.01)		(376,464.01)
උපචිත වියදම් මත අඩුකිරීම්				63,134.65	63,134.65
ආපදා ණය ශේෂය නිවැරදි කිරීම				(95,608.49)	(95,608.49)
වත්කම් මාරු කිරීමේදී සිදුවූ පාඩුව				(923,978.61)	(923,978.61)
2018 දසැම්බර් 31 දිනට ශ්ෂය	**2,800,000.00**	**10,123,532.15**	(376,464.01)	(956,452.45)	**11,590,615.69**

මෙයට අමුණා ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අඛණ්ඩ කොටසකි. වරහන් තුළ ඇති සංඛ්‍යාවලින් දක්වා ඇත්තේ අඩුකිරීම් ය.

	2018	2017
	රු.	රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් මුදල් ගැලීම		
අතිරික්තය/(හිහය)	(376,464.01)	(6,550,394.11)
ජංගම නොවන සංචලන		
පාරිතෝෂික	392,345.00	153,593.79
ක්ෂය කිරීම්	2,625,393.69	2,774,232.66
පෙර වර්ෂයේ ගැලපීම්		
උපචිත වියදම් මත අඩුකිරීම්	63,134.65	-
ආපදා ණය ශේෂය නිවැරදි කිරීම	(95,608.49)	-
ජංගම නොවන සංචලනවලට පසුව මුදල් ගැලීම	2,608,800.84	(3,622,567.66)
කාරක ප්‍රාග්ධන වෙනස්වීම්		
කලින් ගෙවීම්වල (වැඩිවීම)/අඩුවීම	16,458.36	208,795.64
භාණ්ඩ ලේඛනවල (වැඩිවීම)/අඩුවීම	204,795.00	65,125.00
සේවකයින්ට ලබාදුන ණයවල (වැඩිවීම)/අඩුවීම	69,909.45	(488,029.21)
ඉන්වෙන්ට්‍රි අයිතමවල (වැඩිවීම)/අඩුවීම	(4,995.00)	(49,440.00)
ලිපිද්‍රව්‍යවල (තොග) (වැඩිවීම)/අඩුවීම	28,949.40	(14,655.20)
වත්කම්වල (වැඩිවීම)/අඩුවීම	(374,400.00)	
උපඅග්‍රිමවල (වැඩිවීම)/අඩුවීම	-	55,540.50
විශේෂ අත්තිකාරම්වල (වැඩිවීම)/අඩුවීම	2,800.00	(3,200.00)
නොපියවන ලද අත්තිකාරම්වල (වැඩිවීම)/අඩුවීම	-	-
උත්සව අත්තිකාරම්වල (වැඩිවීම)/අඩුවීම	(9,900.00)	1,875.00
ගෙවිය යුතු - (වැඩිවීම)/අඩුවීම	(1,653,457.33)	1,399,089.07
උපඅග්‍රිම පියවීම්වල වැඩිවීම/(අඩුවීම)	2,428.00	-
ගෙවිය යුතු විගණන ගාස්තුවල (වැඩිවීම)/අඩුවීම	(124,620.00)	(4,905.00)
	(1,842,032.12)	1,170,195.80
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ගැලීම	**766,768.72**	**(2,452,371.86)**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් මුදල් ගැලීම		
යන්ත්‍ර සහ පිරියත මිළදී ගැනීම්	(2,019,337.98)	(1,035,765.27)
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ගැලීම	**(2,019,337.98)**	**(1,035,765.27)**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ගැලීම		
භාණ්ඩාගාරයෙන් ලැබුනු ප්‍රාග්ධන	2,800,000.00	2,400,000.00
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ගැලීම	**2,800,000.00**	**2,400,000.00**
මුදල් සහ මුදල් සමාන - ශුද්ධ වැඩිවීම/(අඩුවීම)	**1,537,430.74**	**(1,088,137.13)**
මුදල් සහ මුදල් සමාන - වර්ෂය ආරම්භයේදී	**71,519.56**	**1,159,656.69**
මුදල් සහ මුදල් සමාන - වර්ෂය අවසානයේදී	**1,618,950.30**	**71,519.56**

රාජ්‍ය භාෂා කොමිෂන් සභාව
2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා
මූල්‍ය ප්‍රකාශන සඳහා ගිණුම් පිළිවෙත්

---

1. වාර්තා කරන ආයතනය

රාජ්‍ය භාෂා කොමිෂන් සභාව 1981 අංක 18 දරන රාජ්‍ය භාෂා කොමිෂන් සභා පනත මගින් සංස්ථාපනය කරන ලද පූර්ණ ලෙස රජයට අයත් ව්‍යවස්ථාපිත මණ්ඩල ආයතනයක් වන අතර, එය ජාතික ඒකාබද්ධතා, රාජ්‍ය භාෂා, සමාජ ප්‍රගති සහ හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශ විෂයපථයට අයත් වේ. එහි ලියාපදිංචි කාර්යාලය අංක 40, බුත්ගමුව පාර, රාජගිරිය යන ස්ථානයේ පිහිටා ඇත.

1.1 ප්‍රතිපත්තිමය ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් කටයුතුවල ස්වභාවය

කොමිෂන් සභාවේ ප්‍රතිපත්තිමය ක්‍රියාකාරකම වන්නේ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීමයි.

1.2 සේවක සංඛ්‍යාව

2018 දෙසැම්බර් 31 දිනට කොමිෂන් සභාවේ සේවක සංඛ්‍යාව 20 ක් වූ අතර, එම වර්ෂය සඳහා අනුමත සේවක සංඛ්‍යාව 41 කි.

1.3 මූල්‍ය ප්‍රකාශනවල වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම වෙනුවන් අධ්‍යක්ෂක මණ්ඩලය වගකියනු ලැබේ.

2 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ පදනම

2.1 අනුකූලවීමේ ප්‍රකාශනය

මෙම මූල්‍ය ප්‍රකාශන; මූල්‍ය කාර්යසාධනයේ ප්‍රකාශනය, මුදල් ගැලීමේ ප්‍රකාශනය, සමකොටස්වල (Equity) වෙනස්වීම සහ, මූලය ප්‍රකාශනය සඳහා සටහන් යන කරුණුවලින් සමන්විත වේ. මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරුවන්ගේ ආයතනය විසින් නියම කොට ඇති පරිදි ශ්‍රී ලංකා රජයේ ගිණුම් ප්‍රමිතිවලට අනුකූලව සහ මුදල් සහ ක්‍රම සම්පාදන අමත්‍යාංශය සහ, විගණකාධිපති දෙපාර්මේන්තුව එක්ව මුදල් රගුලාසි සහ අදාළ රජයේ චක්‍රලේඛවල දක්වා ඇති අවශ්‍යතාවලට අනුකූලව පිළියෙල කොට ඇත.

2.2 ඇගයීමේ පදනම

මූල්‍ය ප්‍රකාශන, 1983 අංක 12 දරන පාරිතෝෂික පනත පාදක කරගත් සේවක විශ්‍රාම පාරිතෝෂික හැර ඓතිහාසික පිරිවැය පදනම මත පිළියෙල කොට ඇත. මූල්‍ය ප්‍රකාශනවලට උද්ධමනීය සාධක සඳහා ගැලපීම් කොට නැත.

2.3 ඉදිරිපත් කරනු ලබන මුදල් වර්ගය

මූල්‍ය ප්‍රකාශය ඉදිරිපත් කරනු ලබන්නේ ශ්‍රී ලංකා රුපියල් වලිනි.

ඇස්තමේන්තුවල සැලකිය යුතු ක්ෂේත්‍රවල තොරතුරු සම්බන්ධයෙන් සහ මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගැනෙන ගණන් මත වඩාත් සැලකිය යුතු බලපෑම්වල අවිනිශ්චිත බව වන්නේ පහත කරුණු ය.

සේවකයින්ගේ පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන (සටහන 9)
වත්කම් අපචය කිරීම (සටහන 3.1)

2.4 ද්‍රව්‍යාත්මක බව සහ ඒකරාශි කිරීම

සමාන අයිතමවල එක් එක් ද්‍රව්‍ය වර්ගය වෙන් වෙන්ව ඉදිරිපත් කර ඇත. අසමරූපී වර්ගවල අයිතමයන් හෝ කාර්යයන්, ඒවා නොවැදගත් මිස වෙන් වෙන්ව ගෙනහැර දක්වා ඇත.

2.5 සංසන්දනාත්මක තොරතුරු

සංසන්දනාත්මක තොරතුරු, පවත්නා වර්ෂයේ ඉදිරිපත් කිරීමට සෑම තැනකදීම තහවුරු කරමින් නැවත වර්ග කර ඇත.

3 සුවිශේෂී ගිණුම් පිළිවෙත්

පසුගිය වර්ෂයේ භාවිතා කරන ලද ගිණුම් පිළවෙත් වෙනස් නොවන අතර, ඒවා ස්ථිරවම ආයතනය විසින් අදාළ කරගෙන ඇත.

3.1 වත්කම් සහ ඒවා තක්සේරු කිරීමේ පදනම
දේපළ, යන්ත්‍රෝපකරණ සහ උපකරණ

හඳුනාගැනීම සහ ඇගයීම

දේපළ, යන්ත්‍රෝපකරණ සහ උපකරණ ඒවා ගනු ලැබූ මිළ හෝ ඒ මත වූ යම් වෙනත් ආනුෂංගික වියදම් මත සටහන් කොට ඇත. මෙම වත්කම් පහතින් දක්වා ඇති පදනම මත සපයනු ලබන අඩු සමුච්චිත ක්ෂයවීමේ වියදමෙහි දක්වා ඇත.

දේපළ, යන්ත්‍රෝපකරණ සහ උපකරණවල පිරිවැය, වත්කම් ලබාගැනීමට සෘජුවම අයකළ හැකි වියදමට ඇතුළත් කොට ඇත. මහා භාණ්ඩාගාරයෙන් හෝ වෙනත් රාජ්‍ය අයතනයකින් වත්කම් මාරු කරනු ලබන අවස්ථාවේදී එම වත්කම් ලබාගැනීමට එකී ආයතනයට වැය වූ වියදම හෝ ප්‍රත්‍යාගණනය කරනු ලබන මුදල මත එම වත්කම් පාවිච්චි කරන්නේ නම් එවිට එය වත්කම් පිරිවැය ලෙස සටහන් කරනු ලැබේ.

සම්පූර්ණයෙන් ක්ෂයවී සහ භාවිතා කළ නොහැකි තත්ත්වයේ පවතින වත්කම් එහෙත් ඒවා කොමිෂන් සභාව විසින් භාවිතා කරමින් තිබෙන්නේ නම් ඒවායේ උපයෝගී ආයු කාලය තක්සේරු කළ නොහැකි බැවින් ඒවා නැවත අගය කිරීම හෝ අපචය කිරීම සිදුකරයි. කෙසේ වෙතත් මෙවැනි ආකාරයේ වත්කම් පිළිබඳ තොරතුරු මූල්‍ය ප්‍රකාශන සඳහා වන සටහනෙහි අනාවරණය කරනු ඇත.

3.2 ඇස්තමේන්තු භාවිතය සහ තීරණ

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ඇස්තමේන්තු සෑදීම, තීරණ ගැනීම සහ උපකල්පනය කිරීම, ගිණුම් පිළිවෙත් අදාළ කරගැනීමේදී ඇතිවන බලපෑම, වාර්තාගත වත්කම්, බැරකම්, ආදායම් සහ වියදම් ආදිය පිළිබඳව කළමණාකරනය විසින් සැලකිල්ලට ගැනීමට අවශ්‍ය වේ. ඇස්තමේන්තු සහ උපකල්පනය කිරීම්, තත්ත්ව යටතේ එකඟ විය හැකි යැයි විශ්වාස කෙරෙන ඓතිහාසික අත්දැකීම් සහ වෙනත් විවිධ සාධක මත පදනම් වේ. තථ්‍ය ප්‍රතිඵල ඇස්තමේන්තුගත මුදලින් වෙනස් විය හැකි ය.

ක්ෂය කිරීම

සම්පූර්ණ වර්ෂයේ ක්ෂය කිරීම සපයනු ලබන්නේ එකී අයිතම මිළදී ගනු ලැබූ වර්ෂයේ වන අතර, 2008 වර්ෂයට පෙර මිළදී ගනු ලැබූ අයිතම සඳහා වර්ෂය තුළ කරනු ලැබූ අපහරණය කිරීම්වලට ක්ෂය කිරීම් සපයා නැත. ක්ෂය කිරීම් ගණනය කරනු ලබන්නේ 2008 වර්ෂයෙන් පසුව මිළදී ගනු ලැබූ වත්කම් සඳහා අයිතමය මිළදී ගනු ලැබූ දිනය / අයිතමය අපහරණය කරනු ලැබූ දිනය මත ය.

මේ වර්ෂයට සහ සංසන්දනාත්මක වර්ෂය සඳහා සළුල ආයු කාලය පහත පරිදි වේ.

පිරියත සහ යන්ත්‍ර	අවුරුදු 05 යි
කාර්යාලීය උපකරණ	අවුරුදු 10 යි
මෝටර් රථ	අවුරුදු 04 යි
පරිගණක	අවුරුදු 04 යි
වායුසමීකරණ යන්ත්‍ර	අවුරුදු 05 යි

3.3 භාණ්ඩ ලේඛන

භාණ්ඩ ලේඛන දක්වනු ලබන්නේ පහල පිරිවැයකින් සහ ශුද්ධ උපලබ්ධි අගයකිනි. ශුද්ධ උපලබ්ධි අගය යනු පවාරණ සහ විකුණුම් වියදම්වල ඇස්තමේන්තුගත පිරිවැයෙන් ඇස්තමේන්තුගත විකිණුම් මිළ අඩුකළ පසු ලැබෙන අගයයි. භාණ්ඩ ලේඛනය, කොමිෂන් සභාවේ ප්‍රකාශනවලට අයත් වේ. මෙම ප්‍රකාශනවල උපලබ්ධි අගය යනු මිළ ස්ථාවර වනවිට විකුණුම් මිළ ය. මේ සම්බන්ධයෙන් දැරීමට විකුණුම් පිරිවැය අනුමත කරනු නොලැබේ.

3.4 කලින් ගෙවීම් සහ කළ යුතු ගෙවීම්

කලින් ගෙවීම් සහ කළ යුතු ගෙවීම්, දරණු ලබන තථ්‍ය පිරිවැයෙහි සහ කොන්ත්‍රාත්තුව යටතේ දැරිය යුතු පිරිවැයෙහි දක්වා ඇත.

3.5 සේවකයින්ට ලබාදෙන ණය

සේවකයින්ට ලබාදන ණය පිළිබඳ විස්තර පිරිවැයෙහි සඳහන් කොට ඇත. නුසුදුසු හෝ ආපසු ලබාගත නොහැකි ණය වෙනුවෙන් අනුමැතිය ලබාදී නොමැති හෙයින් එවැනි ණය සඳහා ප්‍රතිපාදන සාදා නොමැත. නුසුසුදු හෝ ආපසු ලබාගත නොහැකි ණය පිළිබඳ විස්තර අනාවරණය කිරීම ලෙස මූල්‍ය ප්‍රකාශයෙහි සඳහන් කොට ඇත.

3.6 පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන

පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන ගණනය කරනු ලබන්නේ 1983 අංක 12 දරන පාරිතෝෂික පනතට අනුකූලව ය. දැනට සිටින ස්ථීර සේවකයින් සඳහා වර්ෂයට අදාළ පාරිතෝෂික ලෙස තමාට හිමි අවසන් මාසයේ මූලික වැටුපෙන් අඩක් වන සේ ගණනය කොට ලබාදෙනු ඇත.

3.7 ආදායම්

පුනරාවර්තන වියදම් වෙනුවෙන් මහා භාණ්ඩාගාරය විසින් නිදහස් කරනු ලබන අක්මුදල් අග්‍රිමය ආදායමක් ලෙස හඳුනාගැනේ. ප්‍රාග්ධන වියදම් සඳහා අක්මුදල් අග්‍රිමය හෝ ප්‍රාග්ධන වියදම්හි සෘජු මාරුකිරීම් හෝ ප්‍රාග්ධන වත්කම්හි සෘජු මාරුකිරීම් කොමිෂන් සභාවේ සමුච්චිත සෘජු ප්‍රාග්ධනායනය ලෙස හඳුනා ගැනේ.

3.8 වියදම්

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයෙහි වියදම් හඳුනාගනු ලබන්නේ දැරීමට සිදුවන පිරිවැයෙහි සෘජු සම්බන්ධය සහ ආදායමෙහි විශේෂිත වූ අයිතමයෙහි ඉපයීම් පදනම් කරගෙන ය. කොමිෂන් සභාවේ ක්‍රියාකාරකම් වෙනුවන් දරනු ලබන සියළුම වියදම් එනම් දේපළ යන්ත්‍රෝපකරණ සහ උපකරණ නඩත්තු කිරීමේදී දැරීමට සිදුවන වියදම් සහ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට යන වියදම් ආදී සියළුම වියදම් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට ඇතුළත් කොට ඇත.

3.9 මුදල් ගැලීමේ ප්‍රකාශනය

මුදල් ගැලීමේ ප්‍රකාශනය පිළියෙල කොට ඇත්තේ සෘජු නොවන ක්‍රමය භාවිතා කරමිනි.

සටහන

1 භාණ්ඩ ලේඛන

ප්‍රකාශන

ප්‍රකාශනයෙහි නම	2018	2017
	රු.	රු.
ඉංග්‍රීසි සිංහල පදමාලා	53,050.00	85,450.00
දෙමළ ඉංග්‍රීසි පදමාලා	24,390.00	34,335.00
දෙමළ විශේෂ පදමාලා	180.00	180.00
පැය 40 හි කෙටිකාලීන පාඨමාලා පොත	491,400.00	653,850.00
එකතුව	**569,020.00**	**773,815.00**

2 කලින් කරන ලද ගෙවීම්

	2018	2017
ඡායා පිටපත් යන්ත්‍රය නඩත්තු කිරීම	-	16,458.36
	-	**16,458.36**

3 සේවකයින්ට ලබාදෙන ණය සහ අත්තිකාරම්

වර්ගය	2018.01.01 දිනට ශේෂය	එකතු කිරීම්	ප්‍රාග්ධන අයකරගැනීම්	2018.12.31 දිනට ශේෂය
උත්සව අත්තිකාරම්	-	120,000.00	110,100.00	9,900.00
ආපදා ණය	2,899,013.05	837,496.73	811,797.70	2,924,712.08
විශේෂ අත්තිකාරම්	3,200.00	48,000.00	50,800.00	400.00
	2,902,213.05	**1,005,496.73**	**972,697.70**	**2,935,012.08**

4 දේපළ, යන්ත්‍රෝපකරණ සහ උපකරණ

පිරිවැය හෝ ප්‍රත්‍යාගණන වටිනාකම

වර්ගය	2018.01.01 දිනට ශේෂය	එකතු කිරීම්/ප්‍රත්‍යාගණනය කිරීම්	අපහරණය කිරීම්	2018.12.31 දිනට ශේෂය
වායුසමීකරණ යන්ත්‍ර	1,930,701.75	-	1,654,887.21	**275,814.54**
පරිගණක	1,709,016.00	586,000.00	-	**2,295,016.00**
මෝටර් රථ	6,365,000.00	-	-	**6,365,000.00**
පිරියත සහ යන්ත්‍ර	347,309.75	-	-	**347,309.75**
කාර්යාලීය ගෘහභාණ්ඩ උපකරණ	6,661,222.82	1,433,337.98	846,578.12	**7,247,982.68**
මුළු පිරිවැය හෝ ප්‍රත්‍යාගණන වටිනාකම	**17,013,250.32**	**2,019,337.98**	**2,501,465.33**	**16,531,122.97**
සමුච්චිත ක්ෂය කිරීම්				
පරිගණක	678,377.04	463,879.00	-	**1,142,256.04**
මෝටර් රථ	1,591,250.00	1,591,250.00	-	**3,182,500.00**
පිරියත සහ යන්ත්‍ර	347,309.75	-	-	**347,309.75**
වායුසමීකරණ යන්ත්‍ර	852,726.70	55,162.91	730,908.60	**176,981.01**
කාර්යාලීය ගෘහභාණ්ඩ උපකරණ	2,844,384.81	515,101.78	846,578.12	**2,512,908.47**
මුළු පිරිවැය හෝ ප්‍රත්‍යාගණන වටිනාකම	**6,314,048.30**	**2,625,393.69**	**1,577,486.72**	**7,361,955.27**
ශුද්ධ පොත් අගය	**10,699,202.02**			**9,169,167.70**

අනාවරණය කිරීම්

1. පිරියත සහ යන්ත්‍රවල අගය 2016 වර්ෂය තුළදී සම්පූර්ණයෙන්ම ක්ෂය කර ඇති අතර, එය 2019 වර්ෂයේදී ප්‍රත්‍යාගණනය කළ යුතු ය.
2. කාර්යාලීය ගෘහභාණ්ඩ සහ උපකරණවල අගය වන රු. 2,061,704 ක මුදල 2016 වර්ෂය තුළදී සම්පූර්ණයෙන්ම ක්ෂය කර ඇති අතර, එය 2019 වර්ෂයේදී ප්‍රත්‍යාගණනය කළ යුතු ය.

5 ගෙවීම්

	2018 (රු.)	2017 (රු.)
ලිපිද්‍රව්‍ය (2841)	13,927.57	112,949.00
පුවත්පත් සහ වාර සඟරා	45,120.00	-
විදුලිය බිල්පත් (2884)	-	83,676.95
වැටුප් (2811)	-	13,838.75
ජලය බිල්පත් (2885)	-	1,487.50
දුරකථන බිල්පත් (2883)	41,564.75	116,727.00
පච්ත්‍රතා සේවා (2886)	-	-
වායුසමීකරණ යන්ත්‍ර නඩත්තු කිරීම්	-	14,500.00
ආරක්ෂක සේවා	-	48,300.00
කාර්යාලීය උපකරණ නඩත්තු කිරීම් (2862)	32,000.00	7,507.20
පරිගණක නඩත්තු කිරීම් (2864)	-	4,000.00
ගොඩනැගිලි නඩත්තු කිරීම් (2861)	-	129,554.06
වෙනත් (2849)	-	9,420.00
අතිකාල ගෙවීම් (2815)	48,862.23	34,500.92
වෙනත් (2819)	12,031.50	332,374.00
කුලී ගෙවීම් (2882)	-	900,000.00
පරිගණක (2204)	-	21,500.00
කාර්යමණ්ඩලය පුහුණු කිරීම් (3304)	-	6,000.00
ගෙවිය යුතු තැන්පතු (2540)	3,250.00	24,500.00
මෝටර් රථ නඩත්තු කිරීම්	10,622.00	-
	207,378.05	**1,860,835.38**

6 පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන

	2018 (රු.)	2017 (රු.)
ඉදිරියට ගෙනා ශේෂය	2,655,923.40	2,502,329.61
වර්ෂය තුළ එකතු කිරීම්	392,345.00	485,967.79
වර්ෂය තුළ ගෙවීම්	-	332,374.00
	3,048,268.40	**2,655,923.40**

7 සමුච්චිත අරමුදල්

	2018 (රු.)	2017 (රු.)
පෙර වර්ෂයේ ගැලපීම්වලට පෙර ඉදිරියට ගෙනා ශේෂය	10,123,532.15	7,531,926.26
<u>අඩුවෙන්</u>		
වත්කම් මාරු කිරීමේදී සිදුවූ අලාභය	(923,978.61)	-
ණය ශේෂයන් නිවැරදි කිරීමේදී සිදුවූ අලාභය	(95,608.49)	-
	9,103,945.05	7,531,926.26
<u>එකතු කිරීම්</u>		
ප්‍රාග්ධන ව්‍යදම් සඳහා භාණ්ඩාගාරයෙන් ලැබුණු මුදල්	2,800,000.00	2,400,000.00
අතිරික්තයට/(ඌණතාවයට) පෙර සමුච්චිත අරමුදල්	11,903,945.05	9,931,926.26
වර්ෂය සඳහා අතිරික්තය/(ඌණතාවය)	(376,464.01)	(6,550,394.11)
පෙර වර්ෂයේ ගැලපීම්	-	-
ප්‍රත්‍යාගණනය කිරීමේදී ලද ලාභය	-	6,300,000.00
ජාතික භාෂා ව්‍යාපෘතියෙන් ලද පරිත්‍යාග	-	442,000.00
උපචිත ව්‍යදම් මත අඩු කිරීම්	63,134.65	-
	11,590,615.69	**10,123,532.15**

8 වෙනත් ආදායම්

	2018 (රු.)	2017 (රු.)
සේවක ණය පොලි	111,908.25	101,628.65
විවිධ ආදායම්	-	400.00
	111,908.25	**102,028.65**

9 වැටුප්, වේතන සහ සේවකයින් සඳහා ප්‍රතිලාභ

	2018 (රු.)	2017 (රු.)
වැටුප් සහ වේතන	8,326,054.27	8,695,265.55
සේවක අර්ථසාධක අරමුලේ දායකත්වය	1,201,215.40	1,550,828.99
සේවා නියුක්තයින්ගේ භාර අරමුලේ දායකත්වය	300,303.86	365,385.44
අතිකාල	505,313.34	301,964.26
වැටුප් දීමනා	2,726,376.56	4,434,272.71
පාරිතෝෂික දීමනා ව්‍යදම්	392,345.00	485,967.79
වෙනත් - 2819	121,439.21	9,000.00
	13,573,047.64	**15,842,684.74**

10 සැපයුම් සහ පරිභෝජ්‍ය භාණ්ඩ

	2018 (රු.)	2017 (රු.)
ලිපිද්‍රව්‍ය	458,391.23	427,683.38
නිල අඳුම්	20,000.00	20,000.00
පුවත්පත් සහ වාර සඟරා	551,740.00	162,274.00
ඉන්ධන සහ ලිහිසි තෙල්	562,499.41	542,553.00
සැපයුම්	-	5,000.00
වෙනත් - 2849	239,804.37	204,383.00
	1,832,435.01	**1,361,893.38**

11 අළුත්වැඩියා සහ නඩත්තු කිරීම්

	2018 (රු.)	2017 (රු.)
ගොඩනැගිලි කුලී ගෙවීම්	1,100,000.00	4,950,000.00
කාර්යාලීය උපකරණ නඩත්තු කිරීම්	166,789.35	234,775.13
කාර්යාලීය ගෘහභාණ්ඩ නඩත්තු කිරීම්	-	2,600.00
පරිගණක නඩත්තු කිරීම්	108,975.00	173,257.50
මෝටර් රථ නඩත්තු කිරීම්	425,026.00	357,860.72
වායුසමීකරණ යන්ත්‍ර නඩත්තු කිරීම්	38,000.00	321,200.00
ෆැක්ස් යන්ත්‍ර නඩත්තු කිරීම්	-	16,866.00
විදුලි සෝපානය නඩත්තු කිරීම	-	153,188.00
ගොඩනැගිලි නඩත්තු කිරීම්	558,682.80	1,841,423.06
රක්ෂණ සහ බලපත්	216,293.27	212,344.42
	2,613,766.42	**8,263,514.83**

12 උපයෝග සහ අනිකුත් සේවාවන්

	2018 (රු.)	2017 (රු.)
දුරකථන සහ අන්තර්ජාල	652,225.26	688,050.32
විදුලිය	7,643.40	648,141.25
පවිත්‍රතා සේවාවන්	-	621,081.67
ආරක්ෂක සේවාවන්	48,300.00	1,110,900.00
බැංකු ගාස්තු	-	-
ජලය	6,288.75	72,497.66
තැපැල් ගාස්තු	100,000.00	126,680.00
	814,457.41	**3,267,350.90**

13 අනිකුත් වියදම්

	2018 (රු.)	2017 (රු.)
බඳවා ගැනීම් සහ විභාග	2,000.00	105,484.50
පරිත්‍යාග කරන ලද පොත් සඳහා වියදම්	204,795.00	65,125.00
ගමන් ගාස්තු (දේශීය/විදේශීය)	143,842.50	81,963.00
	350,637.50	**252,572.50**

14 රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම

	2018 (රු.)	2017 (රු.)
පුහුණු කිරීම්	572,100.00	12,000.00
වැඩමුළු සහ සම්මන්ත්‍රණ	3,579,426.50	3,760,412.75
අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම් වියදම්	270,535.00	328,377.50
වෙනත් - 3070	68,375.00	74,684
දැන්වීම්	534,175.00	35,200.00
	5,024,611.50	**4,210,674.25**

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } ඊඑවඒ/ඩී/ඕඑල්සී/එෆ්එස්/ 01/18/20

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2019 ජූනි 13 දින

සභාපති,

රාජ්‍ය භාෂා කොමිෂන් සභාව

රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ 2018 දෙසැම්බර් 31දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යයසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ආයතනයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 නත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

2015 වර්ෂයේදී අමාත්‍යාංශයෙන් පවරාගෙන තිබූ තක්සේරු වටිනාකම රු.1,000,000 ක් වූ මෝටර් රථය ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත.මාගේ නත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම් වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කොමිසම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය කොමිසම ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් කැබීම හා කොමිසමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම්, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, කොමිසමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මහඟරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම් ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, වෙතනාන්විත මහහැරීම් හෝ අභ්‍යන්තර පාලනයන් මහහැරීම් වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස කොමිසමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරන ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙලිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කොමිසමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් නිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාලත්වය

නිරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව,මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර,විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා කොමිසම විසින් පවත්වාගෙන ගොස් නිබුණි.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ6 (i) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිසමේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිසමේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට කොමිසමට සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ කොමිසමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීති, රීති , විධිවිධානවලට යොමුව	විස්තරය
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
(i) මුදල් රෙගුලාසි 371(2) (ඇ)	අතුරු අග්‍රිමය ලබා දෙන ලද කාර්යය නිමකල විගසම පියවීම් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේදී අවස්ථා පහකදී ලබා දී තිබූ අතුරු අග්‍රිම රු.191,750 ක් දින 15 ක සිට මාස 2 ක කාල පරාසයක ප්‍රමාදයකින් පියවා තිබුණි. තවද, නිලධාරීන් තිදෙනෙකු වෙත නිකුත් කර තිබූ රු.197,700 ක් වූ අත්තිකාරම් මුදලින් සියයට 53 ක සිට සියයට 100 ක පරාසයක ඉතිරිවීම් ආපසු පියවා තිබුණි.
(ii) මුදල් රෙගුලාසි 396	2018 දෙසැම්බර් 31 දිනට නිකුත් කර මාස 6 ක් ඉක්මවූ රු.46,949 ක් වූ චෙක්පත් 16 ක් සම්බන්ධයෙන් 2019 මාර්තු 31 දිනට රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කර නොනිබුණි.
(ආ) 2016 මාර්තු 31 දින අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ	2018 වර්ෂය සඳහා වන භාණ්ඩ සමීක්ෂණ වාර්තා 2019 මාර්තු 17 දිනට පෙර ප්‍රධාන ගණන්දීමේ

3.1.6 නිලධාරියාට පිටපතක් සහිතව විගණකාධිපති වෙත යොමු කල යුතු වුවද, 2019 මැයි 31 දින දක්වාම හාණ්ඩ සමීක්ෂණ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිසමේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිසමේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර හාවිතා කර නොමැති බව.

3. වෙනත් විගණන නිරීක්ෂණ

(අ) 2012 වර්ෂයට පෙර සිට මුද්‍රණය කරන ලද වටිනාකම රු.397,350 ක් වූ පාරිභාෂික පදමාලා සහ කෙටිකාලීන පාඨමාලා පොත් 4415 ක් 2019 ජූනි 10 දින වන විට බෙදා නොහැර තිබුණි. තවද 2017 වර්ෂයේදී එම තොග සමීක්ෂණයට හාජනය කර නොතිබූ අතර, සමාලෝචිත වර්ෂයටද තොග සමීක්ෂණයක් කර නොතිබුණි.

(ආ) 2018 දෙසැම්බර් 31 දිනට පැවති පුරප්පාඩු සංඛ්‍යාව 21 ක් වූ අතර, ඉන් 2016 වර්ෂයේ සිට පුරප්පාඩුව පවතින තනතුරු 13 ක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා පිරවීමට කටයුතු කර නොතිබුණි.

ඩබ්ලිව්. ඒ. ඕ. වික්‍රමරත්න
විගණකාධිපති

"ජනජයසිටි" ගොඩනැගිල්ල, 09 වන මහල, නාවල පාර, රාජගිරිය.
"ஜனஜயசிட்டி" கட்டடத்தொகுதி, 09 ஆம் மாடி, நாவல வீதி, இராஜகிரிய.
"Janajayacity" Building, 09th floor, Nawala Road, Rajagiriya.